සියළුම හිමිකම් ඇවිරිණි]
*All Rights Reserved ]*

**පාසල්වලට සිසුන් තෝරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය**

# 2023

**නැණ ලොවට පා නගන හපනුන්ට මග කියන**

**"අදිති"**

2

II පත්‍රය

පැය 01 ය මිනිත්තු 15

විභාග අංකය ...............................

**විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

01.පහත ඡේදය හොඳින් කියවන්න.

වනාන්තර එළිපෙහෙළි කර වර්ෂාව එන තෙක් හේන් ගොවියෝ බලා සිටිති.කාලගුණ වාර්තා අනුව හේන් ගොවිතැනට වර්ෂාවෙන් ජලය ලැබෙන්නේ අගෝස්තු සිට ඔක්තෝබර් තෙක් මාසවල දී ය.ගොවියෝ ලී කොට සිටුවා වනසතුන්ගෙන් වගා ආරක්ෂා කර ගැනීමට වැටක් නිර්මාණය කරති.මෙසේ මහන්සි වන ගොවීන්ගේ එකම වැයම වන්නේ වනසතුන්ගෙන් බෝගවලට සිදුවිය හැකි විනාශය වළක්වා ගැනීමයි.වීර්යය අත් නොහැර රෑ දවල් මහන්සි වන ගොවියෝ තම බෝග වැඩෙන ආකාරය දැක සතුට වෙති.

- **ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

(i) ගොවියෝ බලා සිටින්නේ කුමක් එනතුරුද? .....................................................................

(ii) මහන්සිවන ගොවීන්ගේ එකම වැයම කුමක්ද? .................................................................

(iii) ගොවියෝ සතුටු වන්නේ කුමක් දැකීමෙන්ද ? .................................................................

(iv) "උත්සාහය"යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් සොයා ලියන්න. .................................

(v) "සතුටු"යන වචනයේ ඇති පිල්ලම් පිළිවෙළින් නම් කරන්න.

.........................................................................................................................

(vi) මූර්ධජ අක්ෂර යෙදුණු වචන දෙකක් උපුටා දක්වන්න.

........................................... ............................................. ( ලකුණු - 06 )

02. වාක්‍යට ගැළපෙන සුදුසු ක්‍රියා පදය (ආඛ්‍යාතය) තෝරා ලියන්න.

(i) මව දරුවන් පෝෂණය .............................

(ii) මම ශිෂ්‍යත්ව විභාගයෙන් සමත් ............................

(iii) ජාතික විරුවෝ රට ආරක්ෂා ................................. ( ලකුණු -03 )

| **කළා ය /කළේය /වෙමි /කළහ /කළෝය** |
|---|

03.පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වාක්‍යයක් හදන්න.

| **සෙල්ලම් / පවනි / ආරම්භ /පන්තිය / කළා ය** |
|---|

( ලකුණු - 01 )

.........................................................................................................................

04.අක්ෂර වින්‍යාසය වැරදි වචනය යටින් ඉරක් අඳින්න.

(i) ප්‍රශ්නය / ප්‍රදර්ශණය / සංදර්ශනය
(ii)සමීක්ෂණ / ගවේෂණය / උෂ්නය
(iii)පාලනය / නිෂ්පල / ප්‍රතිඵල

( ලකුණු - 03 )

05.ගැළපෙන යුගල පද තෝරා හිස්තැන් සම්පූර්ණ කරන්න.

| **තෑගි බෝග / ගමන් බිමන් / අහල පහල** |
|---|

(i) අවුරුදු කාලයට පුංචි ළමයි ............................... ලබා ගැනීමට ආශා කරති.

(ii) රාත්‍රී කාලයට දුර ............................. යාම සුදුසු නොවේ.

(iii) අපි ................................. මිනිසුන්ට උදවු කරමු. ( ලකුණු - 03 )

06.ගැළපෙන විරාම ලකුණු යොදන්න.

| |
|---|
| ඔබතුමා මෙය විෂ සහිත ගසක් බව දැන ගත්තේ කෙසේද |

( ලකුණු - 02 )

07.පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු සම්පූර්ණ කරන්න.

(i) කටුස්සාගේ ........................................................ බැන්දා වගේ.

(ii) ආඩි හත්දෙනාගේ ............................................ වගේ. ( ලකුණු - 02 )

08.වගුව සම්පූර්ණ කරන්න.

| පුරුෂ ලිංග පද | ස්ත්‍රී ලිංග පද |
|---|---|
| සිංහයා | _ _ _ _ _ _ ___ _ _ _ _ _ _ |
| _ _ _ _ _ _ ___ _ _ _ _ _ _ | යෙහෙළිය |

( ලකුණු - 02 )

09.පහත තේරවිල්ල තෝරන්න..

ගජනාළය - ............................................................................
............................................................................
............................................................................
............................................................................ ( ලකුණු - 02 )

10.දී ඇති ඉංග්‍රීසි වචනවල හිස්තැන්වලට ගැළපෙන අකුරු තෝරා ලියන්න.

(i) Waterf....ll - (o /a)

(ii) M.....ther - (o /a ) ( ලකුණු - 02 )

11.රූපය හඳුනාගෙන එහි ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරින්ම ලියන්න.

 ............................................

 ............................................

( ලකුණු - 02 )

12.දී ඇති ඉංග්‍රීසි වචන පහත හිස්තැන්වල යොදමින් අර්ථවත් වැකියක් ලියන්න.

| |
|---|
| brother / is / ~~My~~ / Sunil |

My .................. .......................... ..............................

( ලකුණු - 02 )

13. " පාඩසාලෙ" යන දෙමළ වචනය සඳහා සිංහලෙන් යෙදෙන වචනය ලියන්න. ( ලකුණු - 01 )

.............................................................................................................

14. දී ඇති වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න. ( ලකුණු - 01 )

(i) ඔබේ නම කුමක්ද? -..........................................................................................

15. පහත දී ඇති සංඛ්‍යාවට එකක් එකතු කර එහි සංඛ්‍යා නාමය ලියන්න.

3047 - ........................................................................................................ (ලකුණු - 02)


16.

| | | |
|---|---|---|
| | 5 | |
| 3 | 7 | 0 |

කොටුව තුළ ඇති සියලුම සංඛ්‍යා යොදාගෙන සෑදිය හැකි විශාලම සංඛ්‍යාව ලියන්න.

.................................................................................... (ලකුණු - 02)

17.





මෙම ගණක රාමුවෙන් නිරූපිත සංඛ්‍යාව කීයද?

.......................................................... (ලකුණු - 02)

18.දී ඇති සංඛ්‍යා රටාව සම්පූර්ණ කරන්න.

3 , 7 , 11 , ............ , ............. (ලකුණු - 02)

19.



මෙම රූපයෙන් බාගයක් ( ½) පාට කිරීමට කොටස් කීයක් පාට කළ යුතුද?

......................................................................

(ලකුණු - 02)

20. එක සමාන මුහුණත් 6 ක් දැක ගත හැකි ඝනවස්තුව කුමක්ද?

.......................................................................................... (ලකුණු - 02)

21. දී ඇති රෝම සංඛ්‍යාවේ පෙර හා පසු රෝම සංඛ්‍යා දෙක ලියන්න.

| | | |
|---|---|---|
| .............. | V | ................ |

(ලකුණු - 02)

22.දී ඇති බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | 1Kg එකක මිල | මිලදී ගත් ප්‍රමාණය | වටිනාකම |
|---|---|---|---|
| සීනි | රු.220.00 | 1Kg 500g | ................ |
| සහල් | ................. | 3 Kg | රු.390.00 |
| එකතුව | | | රු.720.00 |

(ලකුණු - 02)

23. පන්තියක සිටින ළමයින් 34 දෙනෙකුට පැන්සල් 3 බැගින් බෙදා දීමට ගුරුතුමිය තීරණය කළාය.ඒ සඳහා අවශ්‍ය මුළු පැන්සල් ගණන කීයද?


........................................................................................ (ලකුණු - 02)

24. රුපියල් 45 වටිනා ඇපල් ගෙඩි 2ක් මිලට ගත් සඳුනි මුදලාලිට රු.100 නෝට්ටුවක් ලබා දුන්නා ය. ඇයට ඉතිරි මුදල ලෙස මුදලාලි කාසි දෙකක් ලබා දුන්නේය.එම කාසි දෙකේ වටිනාකම කොපමණද?

........................................................................................ (ලකුණු - 02)

25. දී ඇති වේලාව ඔරලෝසු මුහුණතේ නිවැරදිව ඇඳ පෙන්වන්න.

| වේලාව - 9.15 |
|---|




(ලකුණු - 02)

26.කෝඩියල් 1500ml බෝතලයකට වතුර 2$L$ 500ml එක් කොට බීම සාදා ඇත.එහි ඇති මුළු බීම ප්‍රමාණය මිලි ලීටර් කීයද?

........................................................................................ (ලකුණු - 02)

27.පිනිදුගේ බර 25kg කි.ඔහුගේ අයියා ඔහු මෙන් දෙගුණයක් බරය.දෙදෙනාගේම මුළු බර කොපමණද?

........................................................................................ (ලකුණු - 02)

28.සෙන්ටිමීටර් 280 ලණු කැබැල්ලකින් 70cm කොටසක් කපා ඉවත් කළේය.ඉතිරි ලණු කැබැල්ල සමාන කොටස් 3කට වෙන් කළ විට එහි එක් කැබැල්ලක දිග කොපමණද?

........................................................................................ (ලකුණු - 02)

29.අඹගෙඩි 242 සමානව කූඩ දෙකකට වෙන්කළ විට එක් කූඩයකට වෙන් වන ගෙඩි ගණන කීයද?

........................................................................................ (ලකුණු - 02)

❖ **ප්‍රශ්න අංක 30 සිට 59 තෙක් නිවැරදි පිළිතුරු තෝරා යටින් ඉරක් අඳින්න.**

30.සූර්යය නමස්කාරය ක්‍රියාකාරකමේ නිරත වීම තුළින්,

(i)ශාරීරික යෝග්‍යතාවය වර්ධනය වේ.

(ii)කායික මානසික හා අධ්‍යාත්මික සුවය ලැබේ.

(iii)විනෝදයෙන් කාලය ගෙවා දැමිය හැකිය.

31.නිදහස් අධ්‍යාපනය දිනා දීමට පුරෝගාමී වූයේ මෙතුමාය.



(1)



(2)



(3)

32.ජාතික කොඩිය සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති අදහස් හොඳින් කියවා වැරදි ප්‍රකාශය තෝරන්න.

(i) ලෝකය ඉදිරියේ අපේ අනන්‍යතාවය පිළිඹිබු කරයි.

(ii) කොඩියේ දිග, පළල මෙන් දෙගුණයකි.


(iii) සිංහල ජාතියට පමණක් මෙය වැදගත් වේ.

33."ස්වයංපෝෂිත රටක ඉර හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේවා"යන පොදු අදහස නිරූපණය කරන්නේ,

(i) රාජ්‍ය ලාංඡනයේ ය.

(ii) ජාතික කොඩියේ ය.

(iii) පුන්කලසේ ය.

34. 

මෙම පරීක්ෂණය තුළින් එළඹිය හැකි නිගමනය වන්නේ,

(i)ජලය රත්කළ හැකි බව

(ii)ජලය රත්වන විට වාෂ්ප වන බව

(iii)හැන්දකින් ජලය රත්කළ හැකි බව

35.මුහුද ගොඩ ගැලීමක් සිදු වුව හොත් අඩුම හානියක් විය හැක්කේ කුමන දිස්ත්‍රික්කයටද?

(1) කොළඹ (2) නුවරඑළිය (3) යාපනය

36.තෙතමනය සහිත භූමිවල වාසය කිරීමට කැමැත්තක් දක්වන සතුන් යුගලය තෝරන්න.

(1) අලියා / කොටියා (2) කුඩැල්ලා / මී ගවයා (3) එළ ගවයා / කුකුළා

37.1996 දී ශ්‍රී ලංකාව ලෝකයේ නම රන්දූ ක්‍රීඩාව කුමක්ද?

(1) ක්‍රිකට් (2) පාපන්දු (3) එල්ලේ

38. බෝ නොවන රෝගයකට නිදසුනක් වන්නේ කුමක්ද?

(1) ඩෙංගු (2) අම්ලපිත්ත රෝගය (3) කොවිඩ් 19

39. වර්තමානය වන විට ධාවනය වන දුම්රියවල වාහන ගැටෙන පුවත් නිතර අසන්නට ලැබෙයි. මෙයට ප්‍රධාන ම හේතුව කුමක් විය හැකිද?

(i) දුම්රිය මාර්ගවල වාහන ධාවනය වීම
(ii) දුම්රිය ගමනාගමනය වැඩි වී තිබීම
(iii) රියදුරන්ගේ අපරික්ෂාකාරී රිය ධාවනය

40. සන්නිවේදනයේ ප්‍රධාන අංග ගණන කීයද?


(1) 4 (2) 5 (3) 3

41. කෘෂිකර්මාන්තයේදී භාවිත කරන උපකරණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(i) වියගහ , සකපෝරුව , පෝරුව
(ii) දැකැත්ත , නගුල , බෝල්ලත්ත
(iii) කරක්ගෙඩිය , නගුල , උදැල්ල

42. අපේ ජීවිතයෙන් බැහැර කළ යුතු දේ කුමක්ද?
(i) නිතරම අන් අයව විවේචනය කිරීම
(ii) අන් අයගේ හැකියාවන් ඇගයීම
(iii) තමන්ට හැකි පරිදි අන් අයට උදවු කිරීම

43. දණ්ඩ චුම්බකයට අල්පෙනිති ආකර්ෂණය වී ඇති ආකාරය නිවැරදිව දැක්වෙන්නේ කුමන රූපයේ ද?




44.ගෙවත්තකට සිදු වන කෘමි උවදුර අවමකර ගැනීමට වඩාත් සුදුසු වන්නේ පහත පිළිතුරු අතරින් කුමක්ද?

(i) කටු සහිත ශාක වැවීම
(ii) දහස් පෙතියා වගා කිරීම
(iii) ශක්තිමත් වැටක් ඉදි කිරීම

45.දී ඇති ආහාර වලින් වඩාත් කෙටි කාලයකින් කල් ඉකුත් වන ආහාරය කුමක්ද?

(1) බිස්කට් (2) යෝගට් (3) කිරිපිටි

46. අනුරාධපුර නගර මධ්‍යයෙන් ගලා යමින්, තන්තිරිමලේ ප්‍රදේශය පසු කර, විල්පත්තු අභයභූමිය ආසන්නයෙන් ගොස්, මන්නාරමින් මුහුදට එකතුවන්නේ මින් කුමක්ද?

(1) මල්වතුඔය (2) කලාඔය (3) මහවැලි ගඟ

47. "මගේ සිත නිවීමෙන් ලැබෙන සැනසිල්ල මට දැනේවා! " මෙම සිතුවිල්ල සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ කීවන පියවරට අයත් වේද?

(1) පළමු පියවරට (2) තෙවන පියවරට (3) හතරවන පියවරට

48.ලෝකයේ බොහෝ රටවල් වැඩකරන ජනතාව සිහිගන්වන දිනයකි.එය තෝරන්න.

(1) ලෝක කම්කරු දිනය (2) වෙසක් උත්සවය (3) සිංහල හින්දු අලුත් අවුරුද්ද

49.ඔලිඳ කෙළිය නම්, ක්‍රීඩාව සඳහා යොදා ගනු ලබන්නේ කුමන බීජද?
(1) මදටිය බීජ (2) ඔලිඳ බීජ (3) කොට්ට පුළුන් බීජ

50.කලා වැව ඉදිකළ රජතුමා විසින්ම කළ තවත් විස්මිත නිර්මාණයකි.
(1) අභයවැව (2) මහවිලච්චිය වැව (3) යෝධ ඇළ

51.බත්,අල,බතල,පිට්ටු වැනි ආහාර වලින් මූලිකවම ශරීරයට සිදුවන්නේ කුමක්ද?
(i) ශරීරය වර්ධනය වීම
(ii) ශරීරයට ශක්තිය ලැබීම
(iii) ශරීරය ලෙඩ රෝග වලින් ආරක්ෂා කිරීම

52.පෘථිවියට යමක් ඇදගැනීමට ඇති බලය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

(1) ආකර්ෂණ බලය (2) විකර්ෂණ බලය (3) ගුරුත්වාකර්ෂණ බලය

53.පාපැදියක කරකැවෙන රෝදයක බලය උපයෝගී කරගෙන විදුලි බල්බයක් දල්වා ගත හැකි උපකරණය කුමක්ද?

(1) ඩයිනමෝව (2) ටෙස්ටරය (3) වියළි කෝෂය

54.බෝලයක් වඩාත් දුරකට පෙරළා යැවිය හැක්කේ කුමන ස්ථානයකද?

(1) වැලි සහිත භූමියක්
(2) පිඟන් ගඩොල් ඇල්ලූ භූමියක්
(3) තණකොළ සහිත භූමියක්

55.ඔබේ පන්ති කාමරය පිළිවෙළකට සකස් කර ගැනීමේ දී ඔබට තනිවම කළ නොහැක්කේ කුමක්ද?

(1) වහලයට නැග එය පිළිසකර කිරීම
(2) කසල බඳුන්වලට වෙන් කිරීම
(3) අතු ගා පිරිසිදු කිරීම

56.ඓතිහාසික රෝස තිරිවානා කන්ද පිහිටා ඇත්තේ,

(1) කොළඹ දිස්ත්‍රික්කයේ ය.
(2) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ය.
(3) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ය.

57.ඕනෑම සුමට පෘෂ්ඨයක ගමන් කළ හැකි සත්වයා කවුද?

(1) හූනා (2) මීයා (3) තලගොයා

58.ගස් බෙන ආශ්‍රිතව බිත්තර දමන පක්ෂීන් කාණ්ඩය තෝරන්න.

(1) මයිනා ,ගිරවා , වඩුකුරුල්ලා
(2) කොච්චෝරුවා , ගිරවා , කොකා
(3) ගිරවා ,කොච්චෝරුවා ,මයිනා

59.දකුණු ආසියානු කලාපයේ වැඩිම ජනගහණයක් ජීවත්වන රට කුමක්ද?

(1) ශ්‍රී ලංකාව
(2) ඉන්දියාව
(3) භූතානය (ලකුණු - 1x30 = 30 )

60.ක්‍රීඩාව සියලුම දෙනාගේ නිරෝගීකමට ඉවහල් වේ. "මා කැමතිම ක්‍රීඩාව"යන මාතෘකාව ගැන අර්ථවත් වැකි 3ක් ලියන්න.(වචන 5 කට නොඅඩු විය යුතුය/අක්ෂර වින්‍යාසය/උක්ත ආඛ්‍යාත සම්බන්ධ ගැන සැලකිලිමත් වන්න.

- ........................................................................................................................................
........................................................................................................................................
- ........................................................................................................................................
........................................................................................................................................
- ........................................................................................................................................
........................................................................................................................................

නිවැරදි අත්අකුරු හා පැහැදිලි බවට ලකුණු - 02 (ලකුණු 06)